අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/PEES/P/31

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023.01.20

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>පාසල්වල පළමු ප්‍රධාන අවධියේ (1 හා 2 ශ්‍රේණිවල ) ඉගෙනුම ලබන සිසුන්ගේ කථන ඉංග්‍රීසි භාෂා කුසලතා ප්‍රවර්ධනය කිරීම</u>**

21 සියවස සඳහා ගෝලීය සමාජයක කටයුතු කළ හැකි පුරවැසි පිරිසක් බිහි කිරීමටත්, වේගයෙන් අලුත්වන විශ්ව දැනුම හා තාක්ෂණ කුසලතාවලට අවතීර්ණවීමට අවශ්‍ය පදනම සකස් කර දීමටත්, ප්‍රාථමික අවධියේ සිටම සිසුන්ට ඉංග්‍රීසි භාෂා හැකියාව ලබා දීම ඉතා වැදගත් ය. මෙම අවශ්‍යතාවය හඳුනාගනිමින් වර්තමානයේ පාසල් පද්ධතිය තුළ 3 වන ශ්‍රේණියේ සිට 11 වන ශ්‍රේණිය දක්වා ම අනිවාර්ය විෂයයක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සිදුකරනු ලැබේ. එසේම ප්‍රාථමික ශ්‍රේණි (1-5 ශ්‍රේණි) සඳහා කථන ඉංග්‍රීසි භාෂා හැකියාවන් වර්ධනය කිරීම සඳහා "ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි" (Activity Based Oral English) වැඩසටහන 1998 වර්ෂයේ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දෙමින්, මේ දක්වාම ක්‍රියාත්මක වෙමින් පවතියි.

2. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය මගින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා දැනට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීමටත් නව්‍ය වැඩසටහන් හඳුන්වා දීමටත් සැලසුම්කර ඇත. එහිදී ප්‍රාථමික අවධියේ සිටම පුළුල් ලෙස "ඉංග්‍රීසි භාෂා කථන හා සවන්දීමේ කුසලතා ප්‍රවර්ධනය කිරීම" සඳහා ප්‍රමුඛ අවධානයක් යොමු කෙරේ.

3. ඒ අනුව පළමුවන ශ්‍රේණියේ සිටම, සිසුන් ඉංග්‍රීසි භාෂාවට නිරාවරණය කිරීම සඳහා පාසල තුළ, පන්ති කාමරය තුළ මෙන්ම ඉන් බැහැරවත් අවස්ථා පුළුල් කිරීම සඳහා සුවිශේෂී වැඩසටහනක් ලෙස "පළමුවන හා දෙවන ශ්‍රේණිවල සිසුන් සඳහා කථන ඉංග්‍රීසි වැඩසටහන" අධ්‍යාපන අමාත්‍යාංශය, ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව ආරම්භ කර ඇත.

**3. 1 වැඩසටහනෙහි අරමුණු :**

I. ඉංග්‍රීසි භාෂා කථන හා සවන්දීමේ කුසලතාවයන් (Listening and Speaking Skills) පළමුවන ශ්‍රේණියේ සිටම සිසුන් තුළ සංවර්ධනය කිරීම.
II. ඉංග්‍රීසි භාෂාව කථා කිරීම සඳහා සිසුන් තුළ පවතින බිය සැක දුරුකිරීම.
III. ඉංග්‍රීසි භාෂාව ඉතා මිත්‍රශීලී, ප්‍රියජනක භාෂාවක් බව සිසුන්ට මෙන්ම ප්‍රාථමික ගුරුවරුන්ට ද තහවුරු කිරීම.
IV. තුන්වන ශ්‍රේණියේ සිට සිසුන්ට විෂයයක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම පහසුකිරීම සඳහා විධිමත් හා ශක්තිමත් පදනමක් දැමීම.

**3.2 වැඩසටහනෙහි අන්තර්ගතය හා හඳුන්වා දෙන සුවිශේෂතා:**

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ නව්‍යකරණය වන "ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි" (Activity Based Oral English) වැඩසටහන, ප්‍රාථමික විෂයමාලාවට සමගාමීව විශේෂයෙන් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ගණිතය විෂය පාදකකොටගත් වචන මාලාව හා පන්තිකාමර විධාන සහිත අන්තර්ගතයන්, කතාන්දර, ගීත සහ නාට්‍ය ඇතුළත් වීඩියෝ, සැලසුම් සහගත ක්‍රීඩා හා ක්‍රියාකාරකම් ආදිය මෙන්ම ප්‍රාථමික ගුරුවරුන් සඳහා ගුරු මාර්ගෝපදේශ, සම්පත් මූලාශ්‍රයන්, අතිරේක කියවීම් සකස්කර ලබාදෙන ඇත.

ඊට අමතරව ඉදිරියේ දී ප්‍රාථමික ගුරුවරුන් සඳහා ඉංග්‍රීසි භාෂා කුසලතා මෙන්ම ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ක්‍රමවේද පිළිබඳව අඛණ්ඩ පුහුණු අවස්ථා ද ලබාදීමට මෙම වැඩසටහන යටතේ සැලසුම් කර ඇත.

**3.3 ගුරු පුහුණුව සහ විදුහල්පතිවරුන් දැනුවත් කිරීම:**

3.3.1 "පළමුවන හා දෙවන ශ්‍රේණිවල සිසුන් සඳහා කථන ඉංග්‍රීසි වැඩසටහන" පිළිබඳව පළාත් මට්ටමින් තෝරා එවනු ලැබූ සම්පත්දායකයින් පුහුණු කිරීම මේ වන විට අවසන් කර ඇත. ඒ අනුව පළමු වතාවට මෙම පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන හරහා පළාත්වල හා කලාපවල ප්‍රාථමික අධ්‍යාපන විෂයභාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, ප්‍රාථමික අධ්‍යාපන ගුරු උපදේශකවරුන් සහ පළාත්වල හා කලාපවල ඉංග්‍රීසි විෂයභාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා ඉංග්‍රීසි විෂයභාර ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම සිදු වේ. මෙම විෂය කණ්ඩායම් දෙකෙහිම අන්තර් සහයෝගයෙන් හා අවබෝධයෙන් යුතුව පාසල තුළ පන්ති කාමරය තුළ මෙම නව වැඩසටහන අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කරවීම එහි අරමුණයි.

3.3.2 ඒ අනුව ඔබ පළාත තුළ ද මෙම වැඩසටහන පිළිබඳව පළමුවන ශ්‍රේණියේ ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරුන් පුහුණු කිරීමේ දී ද ප්‍රාථමික අංශයේ/ පාසලේ ඉංග්‍රීසි විෂය ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරයා/ගුරුවරුන් ද පුහුණු කිරීම ඉතා අත්‍යවශ්‍යය. එමගින් පාසල තුළ ඉතා ඵලදායීව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

3.3.3 ඔබ පළාතේ පුහුණුව ලැබූ සම්පත්දායකයින් මගින්, 2023 වර්ෂයේ පළමුවන ශ්‍රේණියේ ඉගැන්වීම් කටයුතු කිරීමට නියමිත ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීම, 2023 වර්ෂයේ මාර්තු මාසයට පෙර සිදු කිරීම අපේක්ෂා කරනු ලැබේ.

3.3.4 තවද පාසල්වල විදුහල්පතිවරුන් මෙම වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීම ද ප්‍රමුඛ අවශ්‍යතාවයකි. සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින් ප්‍රාථමික පාසල් සහ ප්‍රාථමික අංශ ක්‍රියාත්මක පාසල්වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීම ද ගුරු පුහුණුවට සමගාමීව සිදු කළ යුතුය.

3.3.5 2023 වර්ෂයේ 2 වන ශ්‍රේණියේ ගුරු පුහුණුව, පිළිබඳව පුහුණුකරුවන් පුහුණු කිරීමේ (Training Of Trainers ) වැඩසටහනින් පසුව දැනුම් දෙනු ඇත.

**3.4 වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා තක්සේරුව**

3.4.1 පළමුවන ශ්‍රේණියට හඳුන්වා දෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ වගකීම, පළමුවන ශ්‍රේණියේ ඉගැන්වීම් කටයුතුවල නිරත ගුරුවරයාට මෙන්ම ප්‍රාථමික අංශයේ/ පාසලේ ඉංග්‍රීසි විෂය ඉගැන්වීම් කටයුතු කරන ගුරුවරයා යන දෙදෙනාම වෙත පැවරේ. එහිදී පාඩම් සැලසුම් කිරීමේ සිට ක්‍රියාත්මක කිරීමත් තක්සේරු ක්‍රියාවලිය සඳහාත් අන්තර් සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම විදුහල්පතිවරුන්ගේ වගකීම වේ. පාසල් අධීක්ෂණ ක්‍රියාවලිය හරහා මෙහි ක්‍රියාත්මකභාවය නියාමනයට ලක්කළ යුතු අතර අවශ්‍ය ප්‍රතිපෝෂණ කලාප/පළාත් නිලධාරීන් විසින් ලබාදෙනු ඇත.

3.4.2 දැනට ක්‍රියාත්මක පාසල් කාලය තුළ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම විෂය සමගාමී වැඩසටහන්වලදී යෝග්‍ය පරිදි නම්‍යශීලී ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ හැකි අතර, ඉදිරියේ දී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හරහා මෙම වැඩසටහන සඳහා තවදුරටත් පුළුල් ඉඩ අවකාශ ලැබෙනු ඇත.

3.4.3 වැඩසටහන ක්‍රියාත්මක කිරීම මෙන්ම තක්සේරුව සිදුවිය යුත්තේ සවන්දීම හා කථනය භාවිතයෙන් පමණි. ඉංග්‍රීසි වචන ලිවීම හෝ කියවීම මෙම වැඩසටහන තුළ සිදු නොකරන බැවින් තක්සේරුව තුළ ද එය සිදු නොකළ යුතු බවට තරයේ අවධාරණය කරමි.

## 3.5 දැනුවත් කිරීම, නියාමනය, ප්‍රතිපෝෂණ ලබාදීම හා වාර්තා කිරීම

මෙම වැඩසටහන පිළිබඳව පළාතේ සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුවත් කළ යුතුය. වැඩසටහන නියාමනය කර අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දීම පාසල්, කලාප හා පළාත් මට්ටමෙන් සිදු කළ යුතු අතර, ඔබ වෙත එවනු ලබන නියාමන ආකෘති පත්‍ර හරහා අදාළ වාර්තා අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික අධ්‍යාපන ශාඛාවට එවිය යුතු වේ. විධිමත් නියාමනයක් සෑම මට්ටමකදීම පවත්වා ගැනීම හා ප්‍රතිපෝෂණ ලබාදීම තුළින් මෙම වැඩසටහන ශක්තිමත්ව හා අඛණ්ඩව පවත්වා ගැනීම පළාත් ප්‍රාථමික හා ඉංග්‍රීසි විෂයභාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වන අතර මෙම වැඩසටහන නියාමනය කර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වාර්තා කිරීම සියලු ම පළාත් ප්‍රාථමික අධ්‍යාපන විෂය භාර නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

මෙම වැඩසටහන ප්‍රමුඛ අවශ්‍යතාවයක් ලෙස සලකා, ඉතා සාර්ථකව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ පළාත්වල අදාළ නිලධාරීන් සහ ගුරු උපදේශකවරුන් මෙහෙයවනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.

එම්.එන්.රණසිංහ
අධ්‍යාපන ලේකම්

පිටපත් :

01. ප්‍රධාන ලේකම්, ............................ පළාත - දැ.ගැ.ස
02. පළාත් අධ්‍යාපන ලේකම්, ............................ පළාත - දැ.ගැ.ස